# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2414/07 - 2024 දෙසැම්බර් මස 10 වැනි අඟහරුවාදා - 2024.12.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 104/44 (vi) ඒ

**(87 වන අධිකාරය වූ) භාර ආඥාපනත**

114 වන වගන්තිය යටතේ වන නියමය

"අයිවන් දිසානායක පුන්‍ය භාරය" හි භාරකරුවන්, එනම්-

1. ලලිත් අයිවන් දිසානායක මහතා;
2. ශ්‍රීවන්ති ආරෝෂා පෙරේරා මෙනෙවිය;
3. මියැසි ප්‍රතිභා දිසානායක මෙනෙවිය; සහ
4. නිපුනි භාග්‍යා දිසානායක මෙනෙවිය,

විසින්, (87 වන අධිකාරය වූ) භාර ආඥාපනතේ 114 වන වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබීම සඳහා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා වෙත ඉල්ලුම් කර ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 114 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය, හර්ෂණ නානායක්කාර වන මම, මේ නියමය මගින්, එකී භාරකරුවන් සංස්ථාගත කිරීම සඳහා බලය පවරන අතර-

(අ) ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස්, මඩවල ලියනගේ තිස්ස ලියනගේ විසින් සහතික කරන ලද 2019 මාර්තු මස 1 වන දිනැති අංක 1365 දන භාර ඔප්පුව යටතේ යථා පරිදි පත්කරන ලද ඉහත නම් සඳහන් භාරයේ භාරකරුවන් සහ ඔවුන්ගේ තත්කාලීන අනුප්‍රාප්තිකයන් "අයිවන් දිසානායක පුන්‍ය භාරය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිත සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු බවටද;

(ආ) එකී භාරකරුවන් විසින්, එකී නාමය සහ අභිධානය යටතේ. එහි භාරය වෙනුවෙන්, යම් චංචල හෝ නිශ්චල දේපළක් මිල දී ගැනීම, බාර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම, විකිණීම, හුවමාරු කිරීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, බදු දීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කරනු ලැබිය හැකි බවටද; සහ



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) එකී භාරයට අදාළව පැන නගින සියලු නඩු සහ නඩුකරවල දී, ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් ස්ථානයක යම් අධිකරණයක දී, එකී නාමයෙන් සහ අභිධානයෙන්, එකී භාරකරුවන් විසින් නඩු පැවරීමට සහ නඩු පවරනු ලැබීමට. උත්තර දීමට සහ උත්තර දෙනු ලැබීමට, විත්තිවාචක ඉදිරිපත් කිරීමට සහ විත්තිවාචක ඉදිරිපත් කරනු ලැබීමට නීතිය අනුව හැකියාව සහ බලය ඇත්තේ යැයි ද,

විධාන කොට ප්‍රකාශ කරමි.

මේ නියමය ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ අවශ්‍ය යැයි මා හට පෙනී යන ආකාරයට කලින් කලට වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම කරනු ලැබිය හැකි ය.

**හර්ෂණ නානායක්කාර,**
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0083

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.